(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 157.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2017 මාර්තු මස 24 වැනි සිකුරාදා පූ. භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුනි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු රංජිත් අලුවිහාරේ මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු හේෂාන් විතානගේ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු ඊ. සරවනපවන් මහතා

**ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු අන්නාමලෙයි නඩේසු සිවශක්ති මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

නීල් ඉද්දවල මහතා, වැඩ බලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන :** කථානායකතුමා විසින් මතු පළවන නිවේදනය කරන ලදී,—

"පාර්ලිමේන්තුවේ ගරුත්වය ආරක්ෂා කිරීම සඳහා පහත සඳහන් කරුණු ඔබතුමන්ලාගේ කාරුණික අවධානයට යොමු කරවමි.

සෑම මන්ත්‍රීවරයෙකුම ස්වකීය කථාව සාකච්ඡාවට භාජනය වෙමින් පවතින විෂයයට පමණක් සීමා කළ යුතු බවටත්, කවර මන්ත්‍රීවරයෙකු විසින් හෝ වෙන මන්ත්‍රීවරයෙකු නමින් සඳහන් නොකළ යුතු බවටත්, කවර මන්ත්‍රීවරයෙකු විසින් හෝ අන්‍ය මන්ත්‍රීවරයෙකුට අයුතු චේතනා ආරෝපණය කරමින් කථා නොකළ යුතු බවටත් යනාදී වශයෙන් පාර්ලිමේන්තුවේ සභා ගර්භය තුළ කථා කිරීමේදී ගරු මන්ත්‍රීවරුන් විසින් පිළිපැදිය යුතු රීති පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල ඉතාමත් පැහැදිලිව සඳහන් කර තිබෙන බව මේ අවස්ථාවේදී මෙම ගරු සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානයට යොමු කරනු කැමැත්තෙමි.

එහෙත්, 2017 මාර්තු මස 22 වැනි දින සභා ගර්භය තුළ ගරු මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකු විසින් මෙම උත්තරීතර සභාවේ ගෞරවයට හා කීර්තියට ඉතාමත් හානිකර අයුරින් ගරු අග්‍රාමාත්‍යතුමාට සහ වෙනත් මන්ත්‍රීවරුන්ට අසාධාරණ, අසත්‍ය සහ පදනම් විරහිත චෝදනා එල්ල කරමින් ඉතාමත් අශෝභන අයුරින් අපහාස වන ආකාරයට දිගින් දිගටම කථා කළ බව එම අවස්ථාවට අදාළ හැන්සාඩ් වාර්තා උද්ධෘත අධ්‍යයනය කිරීමෙන් අනතුරුව මා විසින් නිරීක්ෂණය කරන ලද අතර, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග හිතාමතාම උල්ලංඝනය කර ඇති බව ඉතාමත් කනගාටුවෙන් ප්‍රකාශ කරමි.

එවැනි ක්‍රියාවන්වල තිබෙන බරපතළ බව මෙන්ම මන්ත්‍රීවරුන්ගේ ගෞරවයට හානි වීමෙන් සිදු වන අහිතකර බලපෑම පිළිබඳව දැනටමත් එම මන්ත්‍රීවරුන්ව දැනුවත් කළ බවද දන්වනු කැමැත්තෙමි.

ප්‍රජාතන්ත්‍රවාදයේ උත්තරීතර තෝතැන්න වන ව්‍යවස්ථාදායකය තුළදීම මන්ත්‍රීවරුන්ගේ ගෞරවනීයභාවය කෙලෙසන අන්දමින් ක්‍රියා කිරීම පාර්ලිමේන්තුවේ චිරාත් කාලයක සිට පැවත එන සම්ප්‍රදායන්, පරිචයන් සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල විධිවිධානයන්ට අනුකූල නොවන බව සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ විශේෂ අවධානය යොමු කරවීමට කැමැත්තෙමි.

කිසියම් මන්ත්‍රීවරයෙකු සම්බන්ධයෙන් විරෝධතාවක් තිබේ නම් පාර්ලිමේන්තු සම්ප්‍රදාය සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව ක්‍රියා කිරීමට හැකි බවද සඳහන් කරමි.

ආණ්ඩු පාර්ශ්වයේ සහ විරුද්ධ පාර්ශ්වයේ සියලුම ගරු මන්ත්‍රීවරුන් මෙම උත්තරීතර සභා ගර්භයේදී සැම මන්ත්‍රීවරයකුගේම ගෞරවය ආරක්ෂා වන අයුරින් එකිනෙකාට අයුතු ලෙස චෝදනා කිරීමෙන්, අපහාස කිරීමෙන් වැළකෙමින්, වාද විවාදවලට මනා සංයමයකින් යුතුව සහභාගී වීමට වග බලාගත යුතු බවටත්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල සඳහන් විධිවිධානයන්ට හා සම්ප්‍රදායන්ට අනුකූලව මෙම උත්තරීතර සභාවේ දී කටයුතු කළ යුතු බවටත්, මම අවධාරණය කරමි.''

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2016 අංක 24 දරන විසර්ජන පනතේ 6 (1) වගන්තිය යටතේ 2017.02.01 සිට 2017.02.28 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 1987 සැප්තැම්බර් මස 14 දිනැති අංක 471/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ සමාගම් (ලේකම්වරයන් පිළිබඳ) නියෝගවල 2(i)(ආ) වගන්තිය 2007 අංක 7 දරන සමාගම් පනතේ 527 වගන්තිය යටතේ සංශෝධනය කරමින් (ix) යනුවෙන් නව උපවගන්තිය ඇතුළත් කර කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 දෙසැම්බර් 20 දිනැති අංක 1998/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා, එම නියෝග ව්‍යාපාර හා වාණිජ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින්, 2012 වර්ෂය සඳහා වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම** : ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු චමල් රාජපක්ෂ මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද ''ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත'', ''1971 අංක 52 දරන වෙළඳ නැව් පනත යටතේ නියෝග'' සහ ''2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව'' සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව, පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. පෙත්සම්** :

(1) (i) බුත්තල, පෙරහැර මාවත, 11 කණුව දරන ස්ථානයෙහි පදිංචි සජීවනී ගෝමස් මහත්මියගෙන් ලැබුණු 2016.08.29 දිනැති පෙත්සම; සහ

(ii) මහරගම, ඇල්හේන පාර, අංක 108/ඒ දරන ස්ථානයෙහි පදිංචි ටී. එච්. අශෝක ද මෙල් මහතාගෙන් ලැබුණු 2016.09.27 දිනැති පෙත්සම

ගරු විජිත් විජයමුණි සොයිසා මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) ඇහැලියගොඩ, මෝරගල, අංක 508/4 දරන ස්ථානයෙහි පදිංචි ඒ. එම්. අයි. කුමාරසිංහ මහතාගෙන් ලැබුණු 2017.01.09 දිනැති පෙත්සම;

(ii) වත්තල, හැඳල, පල්ලියවත්ත, 3 වැනි පටුමග, අංක 26/11 දරන ස්ථානයෙහි පදිංචි කේ. ජී. ආර්. ඩයස් මහතාගෙන් ලැබුණු 2016.12.05 දිනැති පෙත්සම;

(iii) දේවහුව, බුලනවැව, පේෂකර්ම මධ්‍යස්ථානයේ සේවය කරන ආර්. එම්. නිමල් චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු 2016.12.31 දිනැති පෙත්සම; සහ

(iv) පුවක්පිටිය, හිඟුරල, මහවලදෙණිය, අංක 54/4/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ආරියවතී මහත්මියගෙන් ලැබුණු 2016.12.01 දිනැති පෙත්සම

ගරු වාසුදේව නානායක්කාර මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) අතුරුගිරිය, මිලේනියම් සිටි, කලාප අංක 4, අංක 1036 දරන ස්ථානයෙහි පදිංචි ඒ. ඒ. ප්‍රියකාන්ති මහත්මියගෙන් ලැබුණු 2017.03.07 දිනැති පෙත්සම; සහ

(ii) කැලණිය, දළුගම, ලුම්බිණි මාවත, අංක 4/15 දරන ස්ථානයෙහි පදිංචි ඩී. එම්. දිසානායක මහතාගෙන් ලැබුණු 2017.02.06 දිනැති පෙත්සම

ගරු නිහාල් ගලප්පත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. ශෝක ප්‍රකාශ යෝජනා** : උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, අභාවප්‍රාප්ත ගරු රත්නසිරි වික්‍රමනායක මහතා, හිටපු අග්‍රාමාත්‍ය සහ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

(අ. භා. 2.30 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

මෙම ශෝක ප්‍රකාශ යෝජනාව වෙනත් දිනයක් සඳහා කල් තබනු ලැබේ.

**6. කල් තැබීම (සෞඛ්‍ය සේවය ශක්තිමත් කිරීම)** : "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය යුතුය"යි උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.55 ට ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 5.26 ට, 2017 අප්‍රේල් මස 04 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.